AL/2017/22/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

38620

| | | | |
|---|---|---|---|
| භූගෝල විද්‍යාව I<br>புவியியல் I<br>Geography I | **22 S I** | | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**විභාග අංකය :** ............................

**උපදෙස් :**

- ❋ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත වේ.
- ❋ **I කොටසට** බහුවරණ ප්‍රශ්න **30** ක් ඇතුළත් වේ. **I කොටසට** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** ලිවිය යුතු වේ.
- ❋ **I** සහ **II** කොටස්වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාරදිය යුතු වේ.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| I කොටස | 1 - 30 | |
| II කොටස | 1 | |
| | 2 | |
| | 3 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

tamilguru.lk

## I කොටස

- ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර අඩංගු වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

**1.** ශ්‍රී ලංකාවේ 1 : 50,000 හූ ලක්ෂණ සිතියම්වල සමෝච්ච රේඛා මගින් පමණක් පෙන්නුම් කෙරෙන ලක්ෂණ තුනක් සඳහන් වරණය කුමක් ද?
(1) කොත්කන්ද, ගංදඟරය, වගුරුබිම
(2) මොහොර, උත්තල බෑවුම, ආයත නිම්නය
(3) තීර්යක් නිම්නය, ගංගා විලෝපය, පාෂාණ උද්ගතය
(4) දියබෙත්ම, සුළං කපොල්ල, සානුව
(5) අවතල බෑවුම, නෙරුව, ගංගා විලෝපය (……)

**2.** කිලෝමීටර දෙකක් දිග මාර්ගයක් සිතියමක දැක්වෙන්නේ සෙන්ටිමීටර 20 කිනි. එම සිතියමෙහි නිවැරදි පරිමාණය කුමක් ද?
(1) 1 : 5,000 (2) 1 : 10,000 (3) 1 : 20,000 (4) 1 : 40,000 (5) 1 : 100,000 (……)

**3.** සමසංඛ්‍යා රේඛා සිතියම් මගින් නිරූපණය කළ හැකි භූගෝලීය ලක්ෂණ දෙකක් වන්නේ,
(1) මාර්ග සහ ජලවහනයයි.
(2) උන්නතාංශය සහ වර්ෂාපතනයයි.
(3) භූමි පරිහරණය සහ ජන ඝනත්වයයි.
(4) වන වැස්ම සහ මානව ජනාවාසයි.
(5) වී වගා බිම් සහ පාංශු වර්ගයි. (……)

**4.** පහත දැක්වෙන මිනුම් අතුරෙන් සංඛ්‍යා ශ්‍රේණියක කේන්ද්‍රික ප්‍රවණතාව නිරූපණය කළ හැකි මිනුම කුමක් ද?
(1) පරාසය
(2) ඉහළ චතුර්ථකය
(3) මධ්‍යස්ථය
(4) ඔගිව්ය
(5) ප්‍රතිශතකය (……)

**5.** ද්විත්ව තීරු ප්‍රස්තාරයක් මගින් නිරූපණය සඳහා වඩාත් උචිත වන විචල්‍ය සඳහන් වරණය කුමක් ද?
(1) දිස්ත්‍රික්ක අනුව වැවිලි භෝග ව්‍යාප්තිය
(2) ස්ථානයක උෂ්ණත්වය සහ වර්ෂාපතනය
(3) විවිධ කර්මාන්තවල විදුලිය පරිභෝජනය
(4) වාර්ෂික අපනයන සංයුතිය
(5) දිස්ත්‍රික්ක අනුව යල සහ මහ කන්නවල වී නිෂ්පාදනය (……)

[ දෙවැනි පිටුව බලන්න.

6. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියෙහි (GPS) ප්‍රධාන උපාංග (කොටස්) තුන වනුයේ,
(1) භූමිපාලක ලක්ෂ්‍ය, අභ්‍යවකාශ උපාංගය හා පරිශීලක උපාංගයයි.
(2) පාලක උපාංගය, අභ්‍යවකාශ උපාංගය හා චන්ද්‍රිකා උපාංගයයි.
(3) අභ්‍යවකාශ උපාංගය, පාලක උපාංගය හා පරිශීලක උපාංගයයි.
(4) අභ්‍යවකාශ උපාංගය, චන්ද්‍රිකා උපාංගය හා භූමිපාලක ලක්ෂ්‍යයි.
(5) භූමිපාලක ලක්ෂ්‍ය, චන්ද්‍රිකා උපාංගය හා පරිශීලක උපාංගයයි. (......)

7. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියක පවත්නා චන්ද්‍රිකා සංඛ්‍යාව කොපමණ ද?
(1) 6 (2) 8 (3) 12 (4) 18 (5) 24 (......)

8. රටක ජන සංඛ්‍යාවකින් තෝරා ගන්නා නියැදියක් වශයෙන් සලකනු ලබන්නේ,
(1) රටෙහි ජීවත්වන මුළු ජනසංඛ්‍යාවයි.
(2) අධ්‍යයනයක් සඳහා සංගහනයක් තුළින් තෝරාගන්නා ලද ජනසංඛ්‍යාවයි.
(3) අධ්‍යයනයට භාජනය වන ප්‍රදේශයේ ජීවත්වන මුළු ජනසංඛ්‍යාවයි.
(4) සංගණනයක දී කිසියම් ප්‍රදේශයක ගණනය කරනු ලැබූ ජනසංඛ්‍යාවයි.
(5) ජනසංඛ්‍යාව තුළ දක්නට ලැබෙන සමජාතීය කණ්ඩායමයි. (......)

9. මධ්‍යන්‍ය අපගමන ඵෙක්‍යය සෑම විටෙක ම සමාන වනුයේ,
(1) නිරීක්ෂණ සංඛ්‍යාවට ය. (2) බිංදුවට ය. (3) පරාසයට ය.
(4) සම්මත අපගමනයට ය. (5) මුළු විචලතාවයට ය. (......)

10. පන්තියක සිටින සිසුන්ගේ බර දැක්වෙන දත්ත,
(1) විවික්ත දත්ත වේ. (2) සන්තතික දත්ත වේ.
(3) ගුණාත්මක දත්ත වේ. (4) නාමමාත්‍ර දත්ත වේ.
(5) තරා දත්ත වේ. (......)

11. ගංගාවක යෞවන අවස්ථාවේ දැකිය හැකි භූරූප ලක්ෂණයක් වන්නේ කුමක් ද?
(1) ගංදෙණ (2) ගං කණ්ඩිය (3) ගල්වන (4) දූනුවිල (5) ඩෙල්ටා (......)

12. ශුෂ්ක ප්‍රදේශවල සුළං මගින් නිර්මාණය වන බාදිත භූරූපයක් වන්නේ,
(1) ඉන්සෙල්බර්ග් ය. (2) ඩ්‍රම්ලින් ය. (3) සලපිල ය. (4) වාඩි ය. (5) බාකන් ය. (......)

13. විෂමප්‍රාන්ත හෙළ භූරූපය දැකිය හැකි භූදර්ශනය කුමක් ද?
(1) දියළු තැන්න (2) කඳු ග්ලැසියර
(3) මහාද්වීප ග්ලැසියර (4) උණුසුම් කාන්තාර
(5) වෙරළ කලාප (......)

14. හුනුගල් ප්‍රදේශයක දැකිය හැකි භූරූපයක් වන්නේ,
(1) උවාලා ය. (2) කේම ය. (3) වාඩි ය.
(4) ටොම්බෝලො ය. (5) බහාඩා ය. (......)

15. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන විපරිත පාෂාණ වර්ගයක් වන්නේ,
(1) ගැබ්රෝ ය. (2) ග්‍රැනයිට් ය. (3) ජිප්සම් ය. (4) හුනුගල් ය. (5) නයිස් ය. (......)

16. ඊසානදිග ඕස්ට්‍රේලියානු වෙරළාශ්‍රිතව හටගන්නා නිවර්තන කුණාටු හඳුන්වන්නේ කුමන නමකින් ද?
(1) හරිකේන් (2) ටයිෆූන් (3) විලි විලීස් (4) සුළිසුළං (5) බැගියෝ (......)

17. දේශගුණ විපර්යාස නිසා ඇති වන බලපෑම් දෙකක් සඳහන් වරණය කුමක් ද?
(1) එල්නිනෝ සහ භූමිකම්පා (2) අම්ල වර්ෂා සහ සුළිසුළං
(3) ඕසෝන් ස්ථරය ක්ෂයවීම සහ ලැව් ගිනි (4) සුළිසුළං සහ සුනාමි
(5) මුහුදු මට්ටම ඉහළ යෑම සහ කාන්තාරකරණය (......)

18. නිවර්තන වර්ෂා වනාන්තර දැකිය හැකි ප්‍රදේශ දෙකක් වන්නේ,
(1) බටහිර අප්‍රිකාව සහ ඉන්දුනීසියාව ය. (2) උතුරු වියට්නාමය සහ කැලිෆෝර්නියාව ය.
(3) මධ්‍යම චිලී සහ දකුණු චීනය ය. (4) බටහිර ඕස්ට්‍රේලියාව සහ නයිජීරියාව ය.
(5) මැලේසියාව සහ කැලිෆෝර්නියාව ය. (......)

19. රැම්සා සම්මුතියේ ප්‍රධාන අරමුණ කුමක් ද?
(1) වායු දූෂණය අවම කිරීම (2) වනාන්තර සංරක්ෂණය කිරීම
(3) තෙත්බිම් සංරක්ෂණය කිරීම (4) භූමි හායනය අවම කිරීම
(5) ගෝලීය උණුසුම පාලනය කිරීම (......)

**20.** මධ්‍යධරණී වෙරළ ප්‍රදේශයෙන් පිටත පිහිටි මධ්‍යධරණී බියෝම සහිත ප්‍රදේශ දෙකක් වන්නේ,
(1) කේප්ටවුන් සහ මධ්‍යම ඕස්ට්‍රේලියාවයි. (2) කැලිෆෝර්නියාව සහ වයඹදිග ඕස්ට්‍රේලියාවයි.
(3) මධ්‍යම ආසියාව සහ කැලිෆෝර්නියාවයි. (4) බටහිර අප්‍රිකාව සහ මධ්‍යම ඕස්ට්‍රේලියාවයි.
(5) කේප්ටවුන් සහ කැලිෆෝර්නියාවයි. (......)

**21.** ලෝක ජන සංඛ්‍යාවෙන් පුළුල් ලෙස කථාකරන ප්‍රධාන භාෂා තුන අවරෝහණ ක්‍රමයට පිළිවෙළින්
(1) චීන, ස්පාඤ්ඤ සහ ඉංග්‍රීසි ය. (2) චීන, ඉංග්‍රීසි සහ හිංදි ය.
(3) ඉංග්‍රීසි, චීන සහ හිංදි ය. (4) චීන, හිංදි සහ ස්පාඤ්ඤ ය.
(5) ස්පාඤ්ඤ, චීන සහ ඉංග්‍රීසි ය. (......)

**22.** ශ්‍රී ලංකාවේ අඩුම ජනඝනත්වය සහිත දිස්ත්‍රික්කය කුමක් ද?
(1) මන්නාරම (2) මොණරාගල (3) මුලතිව් (4) වවුනියාව (5) කිළිනොච්චි (......)

**23.** නාගරික මධ්‍යස්ථාන ධුරාවලිය ආරෝහණ ක්‍රමයට නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
(1) නගරය, විශාල නගරය, නාගරික සමූහිතය, නගර යාය
(2) නගරය, නගර යාය, නාගරික සමූහිතය, විශාල නගරය
(3) විශාල නගරය, නගරය, නගර යාය, නාගරික සමූහිතය
(4) නාගරික සමූහිතය, නගර යාය, විශාල නගරය, නගරය
(5) නගරය, නාගරික සමූහිතය, විශාල නගරය, නගර යාය (......)

**24.** උක් සීනි නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තශාලාවක් ස්ථානගත වීම තීරණය කරන ප්‍රධාන සාධකය කුමක් ද?
(1) උසස් තාක්ෂණය ලබාගත හැකි වීම (2) පුහුණු ශ්‍රමය ලබාගත හැකි වීම
(3) මූල්‍ය ප්‍රාග්ධනය ලබාගත හැකි වීම (4) අමුද්‍රව්‍ය ආසන්නව පැවතීම
(5) වරායට ආසන්න වීම (......)

**25.** ග්‍රාමීය-නාගරික (ගැමිරික) ප්‍රදේශවල ප්‍රධාන ගතිලක්ෂණ වඩා නිවැරදිව සඳහන් වරණය කුමක් ද?
(1) මහල් රාශියකින් යුත් ගොඩනැගිලි, නිෂ්ක්‍රමණය, වාණිජ ක්‍රියාකාරකම්
(2) ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රය, නිෂ්ක්‍රමණය, කාර්මික පරිහානිය
(3) ශීඝ්‍ර සංක්‍රමණ, නේවාසික ප්‍රසාරණ, කෘෂි භූමි අඩු වී යෑම
(4) කාර්මීකරණය, අඩු නේවාසික පහසුකම්, මන්දගාමී සංක්‍රමණ
(5) මහල් රාශියකින් යුත් ගොඩනැගිලි, කෘෂි භූමි අඩුවී යෑම, අඩු නේවාසික පහසුකම් (......)

**26.** 'එකලස් කිරීමේ කර්මාන්ත' වර්ගයට ඇතුළත් කර්මාන්තයක් වන්නේ,
(1) උක් සීනි කර්මාන්තයයි. (2) මාළු ටින් කිරීමේ කර්මාන්තයයි.
(3) යකඩ හා වානේ කර්මාන්තයයි. (4) මෝටර් රථවාහන කර්මාන්තයයි.
(5) පෙට්‍රෝරසායනික කර්මාන්තයයි. (......)

**27.** 'දෙමුහුන්කරණය' මගින් ඉතා ශීඝ්‍ර ලෙස අස්වැන්න වර්ධනය කළ භෝග වර්ග දෙකක් වන්නේ,
(1) ඉරිඟු සහ සෝයා බෝංචි ය. (2) වී සහ තිරිඟු ය.
(3) සෝගම් සහ තිරිඟු ය. (4) තිරිඟු සහ මිලට් ය.
(5) වී සහ සෝගම් ය. (......)

**28.** වර්තමානයේ විශාලතම ජාත්‍යන්තර සංක්‍රමණ ධාරාව දැකිය හැකි වන්නේ,
(1) බටහිර යුරෝපයේ සිට උතුරු ඇමෙරිකාව දෙසට ය.
(2) බටහිර අප්‍රිකාවේ සිට ලතින් ඇමෙරිකාව දෙසට ය.
(3) උතුරු අප්‍රිකාවේ සිට දකුණු යුරෝපය දෙසට ය.
(4) නැගෙනහිර ආසියාවේ සිට උතුරු ඇමෙරිකාව දෙසට ය.
(5) දකුණු ආසියාවේ සිට ඔස්ට්‍රේලියාව දෙසට ය. (......)

More Past Papers at
tamilguru.lk

**29.** 'දළ මරණ අනුපාතිකය' යනු,
(1) මධ්‍ය වාර්ෂික ජනසංඛ්‍යාවේ සියයකට සිදුවන මරණ සංඛ්‍යාවයි.
(2) මධ්‍ය වාර්ෂික ජනසංඛ්‍යාවේ පන්සියයකට සිදුවන මරණ සංඛ්‍යාවයි.
(3) මධ්‍ය වාර්ෂික ජනසංඛ්‍යාවේ දහසකට සිදුවන මරණ සංඛ්‍යාවයි.
(4) මධ්‍ය වාර්ෂික ජනසංඛ්‍යාවේ දසදහසකට සිදුවන මරණ සංඛ්‍යාවයි.
(5) මධ්‍ය වාර්ෂික ජනසංඛ්‍යාවේ ලක්ෂයකට සිදුවන මරණ සංඛ්‍යාවයි. (......)

**30.** ලෝකයේ ගල් අඟුරු අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් දෙක වන්නේ,
(1) ඔස්ට්‍රේලියාව සහ ඉන්දුනීසියාවයි. (2) රුසියාව සහ චීනයයි.
(3) කැනඩාව සහ ඔස්ට්‍රේලියාවයි. (4) චීනය සහ දකුණු අප්‍රිකාවයි.
(5) පෝලන්තය සහ වියට්නාමයයි. (......)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

38620

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I

22 S I

## II කොටස

**උපදෙස්:**

* **පළමුවැනි** ප්‍රශ්නයටත්, **දෙක** හා **තුන** ප්‍රශ්නවලින් **එකක්** තෝරාගෙන **ප්‍රශ්න දෙකකට පමණක්** පිළිතුරු සපයන්න.
* 1 : 50,000 රත්නපුරය භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් හා ප්‍රස්තාර කඩදාසියක් ඔබට සපයා ඇත.

**1.** ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50,000 පරිමාණයේ රත්නපුරය භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය මීටර 20 කි. එම සිතියම පදනම් කරගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**සැලකිය යුතුයි:**

* **පිළිතුරු සිතියමෙහි ලිවිය යුතු නො වේ.**
* **ප්‍රශ්න අංකය** සහ අදාළ **උපකොටස්වල අංක** පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.
* සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු **නො වේ.**

(i) සිතියමෙහි **A** සහ **B** චතුරස්‍ර තුළ දැක්වෙන ජලවහන ලක්ෂණ **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) **CD** සහ **EF** රේඛාවලින් දක්වා ඇති බෑවුම් වර්ග **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) **G** චතුරස්‍රය තුළ දැක්වෙන නගරයෙහි පිහිටීමේ කැපීපෙනෙන ලක්ෂණ කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 04 යි)

(iv) සිතියම් ප්‍රදේශයේ ජනාවාස ව්‍යාප්තිය පිළිබඳ ව අදහස් දක්වන්න. (ලකුණු 04 යි)

(v) සිතියම් ප්‍රදේශයෙහි මාර්ග ජාලයේ ව්‍යාප්තිය සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(vi) සිතියමෙහි වයඹදිග කාර්තුවෙහි දැක්වෙන ප්‍රදේශයේ භූවිෂමතාව සහ භූමි පරිහරණය අතර සම්බන්ධතාව කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 04 යි)

**2.** (i) නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමශිල්ප **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ඉහත (i) හි ඔබ නම් කරන ලද නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමශිල්ප **තුන** නිර්වචනය කරන්න. (ලකුණු 06 යි)

(iii) ඉහත (i) හි නම් කරන ලද **එක්** නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමශිල්පයක වාසි **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමශිල්ප භාවිතයේ දී ශ්‍රී ලංකාව මුහුණපාන සීමාකාරී තත්ත්ව **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

More Past Papers at
tamilguru.lk

**3.** වර්ෂාපතන නිරීක්ෂණ මධ්‍යස්ථාන දෙකක වර්ෂයේ පළමු මාස හය තුළ වාර්තා වූ මාසික වර්ෂාපතන වටිනාකම් පහත **වගු අංක 1** මගින් දැක්වේ.

**නිරීක්ෂණ මධ්‍යස්ථාන දෙකක වාර්තා වූ මාසික වර්ෂාපතනය (mm)**

| **මාසය** | **මධ්‍යස්ථාන** | |
|---|---|---|
| | **A** | **B** |
| ජනවාරි | 65 | 44 |
| පෙබරවාරි | 76 | 93 |
| මාර්තු | 62 | 51 |
| අප්‍රේල් | 167 | 32 |
| මැයි | 215 | 105 |
| ජුනි | 165 | 151 |
| **එකතුව** | **750** | **476** |

**වගු අංක 1**

**වගු අංක 1** හි දැක්වෙන දත්ත ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මධ්‍යස්ථාන දෙකෙහි වර්ෂාපතනයෙහි මධ්‍යන්‍යය අගයන් වෙන් වෙන්ව ගණනය කරන්න. (ලකුණු 02 යි)

(ii) මධ්‍යස්ථාන දෙක සඳහා ම මාසික මධ්‍යන්‍ය අපගමන අගයන් ගණනය කරන්න. (ලකුණු 04 යි)

(iii) **වගු අංක 01** දැක්වෙන දත්ත ද්විත්ව තීරු ප්‍රස්තාරයක් මගින් නිරූපණය කරන්න. (ලකුණු 08 යි)

(iv) මධ්‍යස්ථාන දෙකෙහි වර්ෂාපතනයෙහි කැපීපෙනෙන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06 යි)

* * *

38622

AL/2017/22/S-II

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව II<br>புவியியல் II<br>Geography II | 22 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස් :**
* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

**1.** (i) භූගත ජලය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) පරිභෝජනය සඳහා භූගත ජලය ලබා ගන්නා ක්‍රම **හතරක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ භූගත ජලයෙන් ලබා ගන්නා ප්‍රයෝජන **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාවට හේතු වන සාධක **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

**2.** (i) ලෝකයේ ගිනි කඳු බහුලව ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ප්‍රධාන නිෂ්ක්‍රාන්ත යමහල් භූරූප **තුනක්** රූපසටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) ප්‍රධාන ආක්‍රාන්ත යමහල් භූරූප **තුනක්** රූපසටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) යමහල් ක්‍රියාකාරිත්වය නිසා සිදුවන පාරිසරික බලපෑම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) වෙරළක දික් පැතිකඩෙහි ප්‍රධාන කොටස් **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) වෙරළ ප්‍රදේශවල තරංග ක්‍රියාව ආශ්‍රිතව නිර්මාණය වන ඛාදිත භූරූප **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) වෙරළ ප්‍රදේශවල දැකිය හැකි නිධිසාදිත භූරූප **තුනක** නිර්මාණය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ නිරිතදිග වෙරළ ප්‍රදේශයේ තරංග ක්‍රියාකාරිත්වයේ ප්‍රධාන බලපෑම් **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය හා සම්බන්ධව කටයුතු කරන ආයතන **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත (i) හි නම් කළ ආයතන අතුරෙන් **එකක්** තෝරාගෙන, එහි ප්‍රධාන අරමුණු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)


(iii) ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය හා සම්බන්ධ ආයතන සිය අරමුණු ඉටුකර ගැනීමේ දී මුහුණපාන ගැටලු **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම නිසා මතුවී ඇති ප්‍රතිවිපාක **තුනක්** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

[දෙවැනි පිටුව බලන්න.

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

**5.** 2015 හා 2030 වර්ෂ සඳහා වන ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ වයස් ව්‍යුහය පහත **'අ'** සහ **'ආ'** රූපවලින් පිළිවෙළින් දැක්වේ.




**'අ'** රූපය **'ආ'** රූපය

(i) **'අ'** රූපයෙන් දැක්වෙන 2015 වර්ෂයෙහි ශ්‍රී ලංකාවේ වයස් ව්‍යුහයේ කැපීපෙනෙන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) **'අ'** සහ **'ආ'** රූපවලින් දැක්වෙන පරිදි 2015 හා 2030 අතර දී ශ්‍රී ලංකාවේ වයස් ව්‍යුහයෙහි සිදුවන වෙනස්වීම් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ වයස් ව්‍යුහයෙහි සිදුවන වෙනස්වීම්වලට හේතුවන සාධක **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ වයස් ව්‍යුහයෙහි වෙනස්වීම් නිසා ඇතිවන සමාජ-ආර්ථික ප්‍රතිඵල **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**6.** (i) ග්‍රාමීය ජනාවාස වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත (i) හි නම් කළ **එක්** වර්ගයක් තෝරාගෙන, එහි ගති ලක්ෂණවලට හේතුවන සාධක **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) ග්‍රාමීය ජනාවාස, නාගරික ජනාවාසවලින් වෙන් කොට දැක්වෙන ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ ස්ථාපනය කරන ලද නව ජනාවාස පද්ධතියෙහි කැපීපෙනෙන ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**7.** (i) විද්‍යුත් (Electronic) කර්මාන්තය පිළිබඳව ලෝකයේ ප්‍රමුඛ රටවල් **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත (i) හි නම් කළ රටවල විද්‍යුත් කර්මාන්තය ස්ථානගත වීම කෙරෙහි බලපෑ සාධක **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) විද්‍යුත් කර්මාන්තය ප්‍රධාන ගෝලීය කාර්මික අංශයක් බවට පත්වීමට හේතු වූ සාධක **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ විද්‍යුත් කර්මාන්තය සංවර්ධනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

**8.** (i) 'සාර්ක්' (SAARC) සංවිධානයේ සාමාජික රටවල් **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) 'සාර්ක්' සංවිධානයේ ප්‍රධාන අරමුණු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) 'සාර්ක්' සංවිධානයේ සාමාජිකයකු වීමෙන් රටක් භුක්ති විඳින ප්‍රයෝජන **හතරක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) වර්තමානයේ දී 'සාර්ක්' සංවිධානය මුහුණපාන ගැටලු **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

* * *


More Past Papers at
tamilguru.lk

38622

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

**22 I**

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I




SCALE 1 : 50,000

සමෝච්ච රේඛා අන්තරය මීටර 20
சமவுயரக்கோட்டு இடைவெளி 20 மீற்றர்
Contour Interval 20 metres